# මතුගම අධ්‍යාපන කලාපය

## විද්‍යා විෂය ඒකක සංවර්ධන වැඩසටහන

| 8 ශ්‍රේණිය | ශාක කොටස්වල විවිධත්වය හා කෘත්‍යය | ඒකකය - 03 |
|---|---|---|

**නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න**

1. ප්‍රභාසංස්ලේෂණයට අවශ්‍ය සාධකයක් නොවන්නේ.

   1. කාබන්ඩයොක්සයිඩ් 2. ඔක්සිජන් 3. ජලය 4. ආලෝකය

2. මෙහි දක්වා ඇති ශාක කොටස්වල කෘත්‍යය නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ.

   1. ශාක මුල් - ශාකය පසට සවිකිරීම ජලය හා ඛනිජ ලවණ අවශෝෂණය
   2. ශාක පත්‍ර - මල් හා ඵල දරා සිටීම
   3. ශාක කඳ - ප්‍රභාසංස්ලේෂණය
   4. පුෂ්ප - ප්‍රරෝහණය

3. මුදුන්මුලෙහි ආහාර තැන්පත් කර ඇති ශාකයක් වනුයේ

   1. මඤ්ඤොක්කා 2. බතල 3. ඉඟුරු 4. බීට්

4. ප්‍රභාසංස්ලේෂී කඳක් ඇති ශාකයකි.

   1. දලුක් 2. අරලිය 3. වෙනිවැල් 4. උදුපියලිය

5. පත්‍ර මඟින් නව ශාක බිහිකරන ශාක දැක්වෙන පිළිතුර තෝරන්න,

   1. ඇඹුල් ඇඹිලිය, පෙපරෝමියා, අක්කපාන 2. බිගෝනියා, පෙපරෝමියා, අක්කපාන
   3. පෙපරෝමියා, උදුපියලිය, ගොටුකොළ 4. බිගෝනියා, අක්කපාන, උක්

6. ආරෝහක මුල් හෙවත් ආලග්නමුල් සහිත ශාක වන්නේ,

   1. බුලත්, ඕකිඩ් 2. වැනිලා, මහකඩොල් 3. රම්පේ, ගම්මිරිස් 4. බුලත්, ගම්මිරිස්

7. ශ්වසන මුල් හෙවත් වායුධර මුල් දැකිය හැකි ශාක වනුයේ,

   1. කරපිංචා, උක් 2. කිරල, රම්පේ 3. කිරල, මහකඩොල් 4. නවහන්දි, මහකඩොල්

8. මුල් මඟින් නව ශාක බිහිකරන ශාකයක් නොවන්නේ,

   1. පේර 2. බෙලි 3. කරපිංචා 4. කෝමාරිකා

9. කඳවටා පත්‍ර සර්පිලාකාරව පිහිටීම දැකිය හැකි ශාකයක් වන්නේ,

   1. අඹ 2. පේර 3. කැන්ද 4. රුක්අත්තන

10. භූගත කඳන් සඳහා නිදසුන් වන්නේ ,

    1. බතල, ඉඟුරු 2. කහ, ලූනු 3. අර්තාපල්, බීට් 4. කැරට්, බීට්

(ලකුණු 2×10=20)

## B කොටස - රචනා

- **පහත ප්‍රශ්නවලට ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.**

(1). පහත රූපවල ඇති මුල් වර්ග හඳුනා ගෙන නම් කරන්න.



a………………..



b…………………..



d………………………..



e……………………......



f…………….............

(ලකුණු 15)

පහත දැක්වෙන ප්‍රකාශන සත්‍ය නම් (✓) ලකුණද අසත්‍ය නම් (✗) ලකුණද යොදන්න.

1. බෙලි ප්‍රචාරණ මුල් සහිත ශාකයකි. ( )
2. උත්ස්වේදනය අවම කර ගැනීමට කස ශාකය දක්වන අනුවර්තනය වනුයේ පත්‍ර කටු බවට විකරණය වීමයි. ( )
3. බෝංචි ආරෝහක කඳන් සහිත ශාකයකි. ( )
4. ප්‍රභාසංශ්ලේෂණය යනු ශාක වල පත්‍ර වලින් ජලය වාෂ්ප ලෙස පිටවීමයි. ( )
5. කෝමාරිකාවල පත්‍ර මගින් නව ශාක බිහි කරයි. ( )
6. ඕකිඩ් හා වැනිලා ශාකවල වායව මුල් පිහිටයි. ( )
7. ජේරවල මුල් මගින් නව ශාක ඇතිවේ. ( )
8. නුගවල කයිරු මුල් දැකිය හැකිය. ( )
9. උක් කඳේ ආහාර තැන්පත් කර ඇත. ( )
10. කහ යනු මුල්වල ආහාර තැන්පත් කරන ශාකයකි. ( )

(ලකුණු 10)

(2). a. ශුෂ්ක පරිසර තත්වයක් යටතේ වැඩෙන ශාක උත්ස්වේදනය අවම කර ගැනීමට අනුවර්තනය වී ඇත. එවැනි අනුවර්තන 4ක් ලියන්න.

1. ……………………………………………………………………………………………
2. ……………………………………………………………………………………………
3. ……………………………………………………………………………………………
4. …………………………………………………………………………………………… (ල.04)

b. පහත ශාකවල දැකිය හැකි ශුෂ්කරූපී ලක්ෂණය කුමක්දැයි තිත්ඉර මත ලියන්න.

1. අරලිය ........................................ 2. පතොක් ........................................
3. නවහන්දි ........................................ 4. හීරැස්ස ........................................ (ල.04)

c.




1. ශාක පත්‍රවල ජලය ගබඩා කර ගන්නා ශාකයක් නම් කරන්න. ( ල. 02)
2. මෙහි දක්වා ඇති ශාක පත්‍රයේ කොටස් නම් කරන්න.

a ………………………..
b ………………………..
c ………………………..
d ………………………..
e ……………………….. ( ල. 05)

The National e-learning Portal for The General Education